# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2166/46 - 2020 මාර්තු මස 13 වැනි සිකුරාදා - 2020.03.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 12/2014(1)

**2008 අංක 31 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනත**

8(1)(ආ) වන වගන්තිය යටතේ වූ නියමය

2008 අංක 31 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනතේ 8(1)(ආ) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍ය ආචාර්ය බන්දුල ගුණවර්ධන වන මා විසින්, ශ්‍රී ලංකාවේ වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ පරිපාලන කටයුතු බරපතල ලෙස අවුල් වී ඇති බවට සහ එය සාමාන්‍ය තත්ත්වයට නැවත පත් කිරීමට එම ආයතනයේ බලධාරීන් අපොහොසත් වී අති බවට සැහීමට පත්වීමෙන් පසු, එකී පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියමයක්, නියමාවලියක්, ප්‍රඥප්තියක් අතුරු ව්‍යවස්ථාවක්, නියෝගයක් හෝ රීතියක් යටතේ එකී විශ්වවිද්‍යාලයේ උපකුලපති වෙත පිළිවෙලින් පිරිනමන ලද, පනවන ලද හෝ පවරන ලද යම් බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ, කිරීමේ හෝ ඉටු කිරීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාවේ එකී වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ උපකුලපති වෙනුවට නිසි බලධරයා වශයෙන් ජ්‍යෙෂ්ඨ මහාචාර්ය වච්ච පටබැඳිගේ රංජිත් ප්‍රේමලාල් ද සිල්වා 2020 මාර්තු මස 17 වන දින සිට බලපැවැත්වෙන පරිදි මේ නියමය මඟින් පත් කරමි.

**ආචාර්ය බන්දුල ගුණවර්ධන,**
උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍ය.

2020 මාර්තු මස 13 වැනි දින,
කොළඹ දී ය.

03-1041

1A - PG 4938 - 377 - (2020/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*